# අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා සමාජ විද්‍යා ශාඛාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024
## අනුහුරු ප්‍රශ්න පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| භූගෝල විද්‍යාව I | 22 | S | I | |
| පැය තුනයි | | | | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 |

**උපදෙස්:**

✵ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. **I කොටස** බහුවරණ ප්‍රශ්න **40** කින් සමන්විත වන අතර ඒවාට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.

✵ **I කොටසේ** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.

✵ **II** කොටසෙ හි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.

✵ **III කොටස** ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

✵ **I, II** සහ **III** කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු ය.

### I කොටස


**01.** ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම් ශ්‍රේණියේ පොතුවිල් සිතියම සමඟ ඒකාබද්ධ කොට ඇති සිතියම් කොටස වන්නේ,
(1) යාල (2) තිරුක්කෝවිල් (3) කෝමාරි
(4) පානම (5) කල්මුණේ (……...)

**02.** භූගෝලීය තොරතුරු පද්ධතියක් (GIS) තුළ අඩංගු අවකාශීය නොවන දත්ත දැක්වෙන වරණය කුමක් ද ?
(1) ශේෂ කඳුවල මුදුන් උස (2) මහවැලි ජනාවාස ව්‍යාප්තිය
(3) ශ්‍රී ලංකාවේ අධිවේගී මාර්ග ව්‍යාප්තිය (4) පරිපාලන දිස්ත්‍රික්කවල පිහිටීම
(5) නව රබර් වගා බිම් ව්‍යාප්තිය (……...)

**03.** වර්ෂ 2015 සිට 2024 දක්වා ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධන වේගය දැක්වීම සඳහා වඩාත් ම උචිත ප්‍රස්තාර වර්ගය වන්නේ,
(1) සරල තීරු ප්‍රස්තාරය යි. (2) පිරමීඩ ප්‍රස්තාරය යි.
(3) අපගමන තීරු ප්‍රස්තාරය යි. (4) සක් සටහන යි.
(5) සරල රේඛා ප්‍රස්තාරය යි. (……...)

**04.** දත්ත රැස් කිරීම සඳහා නියැදියක් භාවිත කළ යුතු සහ සංගහනය ම භාවිතයට ගත යුතු අවස්ථාවන් දෙකක් පිළිවෙළින් නිවැරදි ව දක්වා ඇති වරණය තෝරන්න.
(1) ජනප්‍රිය නාලිකාව තේරීම හා වෙළඳ ප්‍රවර්ධන සමීක්ෂණය
(2) වෙළඳ ප්‍රවර්ධන සමීක්ෂණ හා ජන සංගණනය
(3) සාමාන්‍ය පෙළ විභාගය හා ජනප්‍රිය නළුවා තේරීම
(4) ජන සංගණනය හා ජනාධිපතිවරණය
(5) උසස් පෙළ විභාගය හා ජන සංගණනය (……...)

**05.** යාබද සිතියම් කොටසේ A-A, B-B සහ C-C භූ ලක්ෂණ පිළිවෙළින් නිවැරදි ව නම් කර ඇති වරණය වන්නේ කුමක් ද ?
(1) අවතල බෑවුම - නිම්නය - රැළි බිම
(2) උත්තල බෑවුම - නෙරුව - රැළි බිම
(3) දළ බෑවුම - උත්තල බෑවුම - තැනිතලාව
(4) උත්තල බෑවුම - නිම්නය - රැළි බිම
(5) උත්තල බෑවුම - නෙරුව - තැනිතලාව (……...)




**06.** සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමවල දී $\overline{x} = \frac{\epsilon x}{n}$ යන සූත්‍රය භාවිත කිරීමෙන් ගණනය කරනු ලබන්නේ,
(1) උපකල්පිත මධ්‍යන්‍යය යි.
(2) අසමූහිත දත්ත ව්‍යාප්තියක මධ්‍යන්‍යය යි.
(3) සමූහිත දත්ත ව්‍යාප්තියක මධ්‍යස්ථය යි.
(4) අසමූහිත දත්ත ව්‍යාප්තියක මධ්‍යස්ථය යි.
(5) සමූහිත දත්ත ව්‍යාප්තියක මධ්‍යන්‍යය යි. (……...)

**07.** ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය (GPS) හා සම්බන්ධ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ මින් කුමක් ද ?
(1) කිසියම් වස්තුවක පිහිටීම නිවැරදි ව ලබා ගත හැකි පද්ධතියකි.
(2) සෑම චන්ද්‍රිකාවක් ම තමාට හිමි කක්ෂ මාර්ගයේ පැයට කි.මී. 22,200 ක වේගයෙන් ගමන් කරයි.
(3) අභ්‍යවකාශයෙහි චන්ද්‍රිකා 24 ක් ක්‍රියාත්මක වන අතර, ඉන් 7 ක් හදිසි අවස්ථාවල දී භාවිත කරයි.
(4) සෑම මහාද්වීපයක ම ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථාන පිහිටුවා ඇත.
(5) වාසර වේදිකා භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ මූලික උපාංගයකි. (……...)

**08.** කිසියම් පර්යේෂණ අරමුණක් සඳහා ම රැස්කරගන්නා නිසා වඩාත් විශ්වාසදායී දත්ත ලෙස සැලකිය හැක්කේ,
(1) ප්‍රමාණාත්මක දත්ත යි.
(2) ගුණාත්මක දත්ත යි.
(3) විවික්ත දත්ත යි.
(4) අසමූහිත දත්ත යි.
(5) ප්‍රාථමික දත්ත යි. (……...)

**09.** කිලෝමීටර් 8 ක දිගින් යුත් මාර්ග කොටසක් 1:25,000 පරිමාණයේ සිතියමක දැක් වූ විට එහි දිග සෙන්ටිමීටර් කීයද ?
(1) 4 cm (2) 8 cm (3) 16 cm (4) 32 cm (5) 40 cm (……...)

**10.** දේශාංශවලට සමාන්තරව ගමන් කරනු ලබන දූරස්ථ සංවේද (RS) චන්ද්‍රිකා හඳුන්වනු ලබන්නේ,
(1) භූ ස්ථාවර චන්ද්‍රිකා ලෙස ය.
(2) කාලගුණ චන්ද්‍රිකා ලෙස ය.
(3) ධ්‍රැවක කක්ෂ චන්ද්‍රිකා ලෙස ය.
(4) භූ සමකාලීන චන්ද්‍රිකා ලෙස ය.
(5) ඉහළ මට්ටමේ චන්ද්‍රිකා ලෙස ය. (……...)

**11.** භූගෝල විද්‍යා අධ්‍යයනය සම්බන්ධයෙන් රිචඩ් හාර්ට්ෂෝන් ඉදිරිපත් කළ නිර්වචනයෙහි අර්ථය සරල ව, නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.
(1) පෘථිවියේ භූගෝලීය රටාවන් කාලික ව වෙනස් වේ.
(2) මානුෂ ක්‍රියාකාරකම්වලින් ගොඩනැගෙන භූ දර්ශනය විවිධත්වයෙන් යුක්ත වේ.
(3) භූගෝල විද්‍යාවේ කාර්යභාරය වන්නේ මිනිස්-පරිසර අන්තර් සබඳතා පිළිබඳ අධ්‍යයනය කිරීමයි.
(4) ප්‍රාදේශීය සහ කාලික දර්ශයකින් භූගෝලීය රටා හඳුනාගැනීම භෞතික භූගෝල විද්‍යා අධ්‍යයනයකින් සිදු වේ.
(5) භූගෝල විද්‍යා අධ්‍යයනයකින් සිදුවන්නේ පෘථිවියේ අවකාශීය විවිධත්වය විමසා බැලීම යි. (……...)

**12.** පෘථිවිය මත නිරතුරුව ම භෞතික ක්‍රියාවලි සිදු වේ. මිනිසාගේ මැදිහත් වීමෙන්,
(1) භෞතික ක්‍රියාවලි සියල්ල ක්ෂණික ව සිදු වේ.
(2) භෞතික ක්‍රියාවලින් හි තීව්‍රතාව වෙනස් වේ.
(3) භෞතික භූ දර්ශනය වෙනසකට ලක් නොවේ.
(4) තම පැවැත්ම සඳහා ජෛව පරිසරය එලෙස ම පවත්වාගෙන යයි.
(5) මානුෂ භූ දර්ශනය නිර්මාණය කිරීම සඳහා භෞතික පරිසරය සම්පූර්ණයෙන් ම වෙනසකට භාජනය වේ.
(……...)

**13.** යමකම ක්‍රියාවලිය මගින් නිර්මාණය වන මූලික පාෂාණ යුගලය දැක්වෙන නිවැරදි පිළිතුර මින් කුමක් ද ?
(1) වැලිගල් හා ගිනිගල්
(2) මැටි හා කිරිගරුඬ
(3) ක්වාට්සයිට් හා ඩොලමයිට්
(4) ග්‍රැනයිට් හා ඩයොරයිට්
(5) ශල්ක හා මැටි (……...)

**14.** ආම්ලික ආග්නේය පාෂාණයක ලක්ෂණයක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) යකඩ ප්‍රතිශතය 20% - 25% පමණ වීම
(2) සිලිකා ප්‍රතිශතය 45% ට අඩු වීම
(3) තද කළු පැහැයෙන් යුක්ත වීම
(4) යකඩ හා මැග්නීසියම් ඛනිජ බහුල වීම
(5) ද්‍රව ස්වභාවයෙන් පැවතීම (……...)

**15.** පාංශු පැතිකඩක මහල් අතරින් මතුපිට පෘෂ්ඨයේ සිට ක්ෂරණය වන ඛනිජ පෝෂක බහුල ව තැන්පත් වන පාංශු මහල වන්නේ,
(1) O මහල ය. (2) A මහල ය. (3) B මහල ය. (4) C මහල ය. (5) R මහල ය. (……...)

**16.** පහත භූ රූප නිර්මාණය වන බහිර්ජන්‍යකාරක පිළිවෙළින් ඇතුළත් වන වරණය තෝරන්න.

A - ගිරිවිල B - රළබුන් පිළ C - මේසාව හා බියුට

(1) A - සුළඟ B - ග්ලැසියර් C - ගංගා
(2) A - භූගත ජලය B - තරංග C - ග්ලැසියර්
(3) A - ගංගා B - ග්ලැසියර් C - සුළඟ
(4) A - ග්ලැසියර් B - තරංග C - සුළඟ
(5) A - ග්ලැසියර් B - සුළඟ C - තරංග (……...)

**17.** ජල චක්‍රයේ ප්‍රධාන සංරචකයක් වනුයේ,
(1) භෞතික ජීර්ණ ක්‍රියාවලිය යි.
(2) ග්ලැසියර්කරණය යි.
(3) භූ විකිරණය යි.
(4) සූර්ය විකිරණය යි.
(5) අධිධාවිතය යි. (……...)

**18.** කෙපන් ගේ දේශගුණ වර්ගීකරණයේ වියළි දේශගුණ (B) වර්ගයේ කැපී පෙනෙන ලක්ෂණයක් දැක්වෙන වරණය තෝරන්න.
(1) වාර්ෂික වර්ෂාපතනය මි.මී. 70 ට අඩු ය.
(2) වර්ෂාපතනය වාෂ්පීකරණය ඉක්මවා යයි.
(3) සෑම මසක ම සෙ.මී. 600 ට වැඩි වර්ෂාපතනයක් ලැබේ.
(4) මෝසම් සෘතුවෙහි අධික වර්ෂාපතනයක් ලැබේ.
(5) සෑම මාසයක ම සෙ.මී. 30 ට වැඩි වර්ෂාපතනයක් ලැබේ. (……...)

**19.** මධ්‍ය කඳුකරයේ බටහිර බෑවුම්වල උපරිම වර්ෂාපතනයක් වාර්තා වන ප්‍රදේශය වනුයේ,
(1) නකල්ස් ය. (2) මාලිබොඩ ය. (3) බදුල්ල ය.
(4) ඇහැලියගොඩ ය. (5) නුවරඑළිය ය. (……...)

**20.** ගෝලීය දේශගුණ වෙනස්වීම් කෙරෙහි බලපාන බාහිර ක්‍රියාවලිය මින් කුමක් ද ?
(1) හරිතාගාර ආවරණය (2) සාගරික සංසරණය
(3) සූර්ය ලප (4) යමහල් විදාරණය
(5) එල්-නිනෝ සංසිද්ධිය (……...)

**21.** කිසියම් ප්‍රදේශයක ජලය සංචිත වන ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් භාවිතයට ගැනීම හඳුන්වනු ලබන්නේ,
(1) ජල සම්පත් අවභාවිතය ලෙස ය. (2) ජලය අපතේ යැවීම යි.
(3) ජල සම්පත් අධිභාවිතය යි. (4) ජල දූෂණය යි.
(5) ජලය ප්‍රතිචක්‍රීකරණය යි. (……...)

**22.** උත්තරාර්ධ ගෝලයේ මහාද්වීපවල අඛණ්ඩ ව නැගෙනහිර-බටහිර අතට විහිදී ඇති බියෝමය දැක්වෙන පිළිතුර වන්නේ මින් කුමක් ද ?
(1) සැවනා බියෝමය (2) මධ්‍යධරණී බියෝමය
(3) සෞම්‍ය කලාපීය වනාන්තර බියෝමය (4) තුන්ද්‍රා බියෝමය
(5) ටයිගා බියෝමය (……...)

**23.** වර්ෂා කාලයේ දී ජලයෙන් යටවන, ජලය රැඳී පවතින පහත් බිම් ආශ්‍රිත ව ව්‍යාප්ත ව ඇති තෘණ භූමි පරිසර පද්ධතිය වනුයේ,
(1) විල්ලු ය. (2) තෙත් පතන ය. (3) දමන ය.
(4) වියළි පතන ය. (5) කඩොලාන ය. (……...)


**24.** ලෝකයේ ලැව්ගිනි උපද්‍රවය බහුල ව දැකිය හැකි සෞම්‍ය කලාපීය වියළි දේශගුණයක් පවතින ප්‍රදේශයක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) වෙනිසියුලාවේ ලානොස් (2) අප්‍රිකාවේ සැවනා (3) බ්‍රසීලයේ කැම්පොස්
(4) කැනඩාවේ ඇල්බර්ටා ප්‍රදේශය (5) ඇමසන් වනාන්තර ප්‍රදේශය (……...)

**25.** එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ (UNEP) 'කර්මාන්ත හා පරිසරය' පිළිබඳ විෂය ක්ෂේත්‍රයට අදාළ විශේෂ ලේකම් කාර්යාලය පිහිටා ඇති නගරය වන්නේ මින් කුමක් ද ?
(1) ජිනීවා (2) පැරිස් (3) බොන් (4) බැංකොක් (5) මෙක්සිකෝ සිටි (……...)

**26.** වයස අවුරුදු 60 සහ ඊට ඉහළ ජන සංඛ්‍යාව, වයස අවුරුදු 15 ට අඩු ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම,
(1) ජන සංඛ්‍යා වර්ධන අනුපාත යි. (2) පුම්තිරි අනුපාතය යි.
(3) යැපුම් දර්ශකය යි. (4) ශ්‍රම බලකායේ ප්‍රමාණය යි.
(5) වියපත් දර්ශකය යි. (……...)

**27.** 2013 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ උපත් ශීඝ්‍රතාව ඉහළ අගයක් ගත් දිස්ත්‍රික්ක අනුපිළිවෙළට සැකසූ නිවැරදි පිළිතුර කුමක් ද ?
(1) කොළඹ - ගම්පහ - මඩකලපුව (2) කිලිනොච්චි - අම්පාර - පුත්තලම
(3) මොනරාගල - කිලිනොච්චි - මඩකලපුව (4) හම්බන්තොට - පුත්තලම - අම්පාර
(5) මුලතිව් - ගම්පහ - කොළඹ (……...)

**28.** යාබද රූප සටහනින් දැක්වෙන ජන සංඛ්‍යා පිරමීඩයෙන් අනාවරණය වන ජන සංඛ්‍යාවේ ව්‍යුහාත්මක ලක්ෂණ නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.



(1) ඉහළ උපත් අනුපාතිකය - පහළ බසින මරණ අනුපාතිකය - අඩු ආයු අපේක්ෂාව
(2) පහළ බසින උපත් හා මරණ අනුපාතිකය - පහළ ආයු අපේක්ෂාව
(3) පහළ බසින උපත් හා මරණ අනුපාතිකය - ඉහළ ආයු අපේක්ෂාව
(4) ඉහළ උපත් අනුපාතිකය - පහළ මරණ අනුපාතිකය - ඉහළ ආයු අපේක්ෂාව
(5) ඉහළ උපත් අනුපාතිකය - ඉහළ මරණ අනුපාතිකය - අඩු ආයු අපේක්ෂාව (……...)

**29.** සංවර්ධනය වෙමින් පවතින රටවල ගැමි නාගරික ජනාවාසවල ස්වභාවය නිවැරදි ව සඳහන් වන ප්‍රකාශය තෝරන්න.
(1) ගමෙන් පැමිණ නගරයේ රැකියා කරන සංක්‍රමණිකයන්ගෙන් ගැමි නාගරික කලාප නිර්මාණය වේ.
(2) නගරවල පවත්නා ආන්තික බිම් ගැමි නාගරික කලාප ලෙස වර්ධනය වේ.
(3) පැල්පත් සහ මුඩුක්කු බහුල ව ව්‍යාප්ත වූ කලාපය ගැමි නාගරික කලාපය වේ.
(4) නාගරික හර ප්‍රදේශවල ජීවත් වූවන් නාගරික තදබදයෙන් මිදීම සඳහා පිහිටුවා ගත් කලාප වේ.
(5) ගම හා උප නගර අතර වර්ධනය වන ජනාවාස වර්ගය ගැමි නාගරික කලාප වේ. (……...)

**30.** ලෝකයේ ඉහළ ම නාගරීකරණයක් සහිත රටවල් දහය අතර ඇති (2014) මැද පෙරදිග කලාපයේ රටක් හා දකුණු ඇමරිකානු කලාපයේ රටක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ඕමානය හා ආර්ජන්ටිනාව (2) කටාර් හා බ්‍රසීලය
(3) සෞදි අරාබිය හා වෙනිසියුලාව (4) කුවේට් හා උරුගුවේ
(5) කටාර් හා කොලොම්බියාව (……...)

**31.** ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත සමාජ ආර්ථික ගැටළු විසඳීමේ දී අවධානය යොමු කළ යුතු මූලික අංශයක් වන්නේ,

(1) නිවාස සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීම (2) මහා මාර්ග සංවර්ධනය හා නඩත්තුව
(3) නාගරික ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම (4) මහා නාගරික කලාප සංවර්ධනය
(5) නාගරික සමාජ විරෝධී ක්‍රියා පාලනය (……...)

**32.** ජෛවීය කෘෂිකර්මාන්තයේ පාරිසරික බලපෑමක් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) ජෛව විවිධත්වයට හානි ඇති වීම
(2) ලැබෙන අස්වනු ප්‍රමාණය අඩු වීම
(3) විවිධ පාරිසරික තත්ත්වයන්ට ඔරොත්තු දෙන ශාක හා සත්ත්ව ප්‍රජා ඇති වීම
(4) දේශගුණ වෙනස් වීම් ඇති වීම
(5) පරිසරයට රසායනික ද්‍රව්‍යවලින් සිදුවන හානි අවම වීම (……...)

**33.** මුහුන් තාක්ෂණය භාවිතයෙන් අප්‍රිකානු ප්‍රදේශවලට හඳුන්වා දුන් වී වර්ගය වන්නේ,

(1) නෙරිකාස් ය. (2) BG 407 H ය. (3) IR 36 ය. (4) IR 8 ය. (5) TN-1 ය. (……...)

**34.** ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතට සහ ඌව පළාතට අයත් විශේෂ ආර්ථික මධ්‍යස්ථාන දෙකක් පිළිවෙළින් නිවැරදි ව දැක්වෙන පිළිතුර මින් කුමක් ද ?

(1) දඹුල්ල - මීගොඩ (2) දඹුල්ල - කැප්පෙටිපොළ (3) කැප්පෙටිපොළ - තඹුත්තේගම
(4) වැලිසර - දඹුල්ල (5) නාරාහේන්පිට - මීගොඩ (……...)

**35.** වර්තමානයේ බලශක්තිය පදනම් ව කර්මාන්ත ස්ථානගත කිරීමේ දී අවධානය යොමු වී ඇති ක්ෂේත්‍රයක් දැක්වෙන පිළිතුර මින් කුමක් ද ?


(1) බලශක්ති සංචිතවල ප්‍රමාණය (2) බලශක්තිය කාලීන ව වෙනස් වීමට ඇති හැකියාව
(3) ප්‍රවාහනය කිරීමට ඇති හැකියාව (4) පරිසරය කෙරෙහි බලපාන ආකාරය
(5) විකල්ප බලශක්ති භාවිතයට ඇති හැකියාව (……...)

**36.** ඉල්මනයිට් ඛනිජය බහුල ව භාවිත කරනු ලබන්නේ,

(1) ලෝහ සම්මිශ්‍රණය සඳහා ය. (2) තීන්ත නිෂ්පාදනය සඳහා ය.
(3) ටයිටේනියම් ලෝහය නිපදවීම සඳහා ය. (4) පොහොර නිෂ්පාදනය සඳහා ය.
(5) පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා ය. (……...)

**37.** යාබද සිතියමෙහි සීනී සහ සිමෙන්ති යන කර්මාන්ත දෙක ම ස්ථානගත වී ඇති දිස්ත්‍රික්කයක් දැක්වෙන අක්ෂරය තෝරන්න.

(1) A
(2) B
(3) C
(4) D
(5) E




(……...)

**38.** ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රභේද අතර වික්‍රමයන් ආශ්‍රිත සංචාරක ආකර්ෂණයක් සහිත ප්‍රදේශයක් වන්නේ,

(1) කිතුල්ගල ය. (2) කතරගම ය. (3) සිංහරාජය ය.
(4) නිලාවේලි ය. (5) බුන්දල ය. (……...)

**39.** 'ගෝලීයකරණය' යන අදහස වඩාත් මැනවින් විස්තර කෙරෙන ප්‍රකාශය මින් කුමක් ද ?

(1) තොරතුරු හා සන්නිවේදනය තුළින් ලෝකය එකට සම්බන්ධ වී තිබීම
(2) සමස්ත ගෝලීය ක්‍රියාකාරකම් සංකීර්ණත්වයට පත්වීම
(3) සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් අන්‍යෝන්‍ය වශයෙන් එක් ව කටයුතු කිරීම
(4) ලාබ ඉපැයීමේ පරමාර්ථයෙන් සමස්ත ලෝකය ම ජාත්‍යන්තර ජාලයට එකතු කර ගැනීම
(5) සමස්ත ලෝකය ම විවිධ අංශ ඔස්සේ සම්බන්ධතා පවත්වාගැනීමේ ක්‍රියාවලිය (……...)

**40.** මෙහි A හා B මගින් දැක්වෙන කලාපීය සංවිධාන දෙකෙහි ආරම්භය සිදු වූ නගර දෙක නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) A - ජකර්තා B - මාලේ
(2) A - බැංකොක් B - ඩකා
(3) A - ඩකා B - බැංකොක්
(4) A - මැනිලා B - කාබුල්
(5) A - බැංකොක් B - නවදිල්ලි (……...)

❋ ❋ ❋ ❋

# අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා සමාජ විද්‍යා ශාඛාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024
## අනුහුරු ප්‍රශ්න පත්‍රය

| භූගෝල විද්‍යාව I | 22 | S | I |
|---|---|---|---|

**උපදෙස්:**
- ❋ **II** කොටසෙ හි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- ❋ **III කොටස** ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- ❋ මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50,000 භූ ලක්ෂණ සිතියමක කොටසක් ද, ලෝක ආකෘති සිතියමක් ද සපයනු ලැබේ.

## II කොටස

**1.** ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එම සිතියම පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- **i.** **A - A** මගින් දැක්වෙන භූ ලක්ෂණය කුමක්ද ? (ලකුණු 01)
- **ii.** **B** අක්ෂරයෙන් දැක්වෙන පරිපාලන මායිම නම් කරන්න. (ලකුණු 01)
- **iii.** **C** අක්ෂරයෙන් දැක්වෙන ප්‍රදේශයේ ව්‍යාප්ත ව ඇති වෘක්ෂලතා වර්ගය කුමක් ද ? (ලකුණු 01)
- **iv.** සිතියම් ප්‍රදේශයේ **D, E, F** යන ස්ථාන අතරින් උච්චත්වය වැඩි ම ස්ථානය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද ? (ලකුණු 01)
- **v.** **G** චතුරස්‍රය තුළ ඇති පොදු සේවා සපයන ආයතන **හතරක්** නම් කරන්න. (ලකුණු 02)
- **vi.** B3 මාර්ග කොටසේ දුර කිලෝ මීටර්වලින් දක්වන්න. (ලකුණු 02)
- **vii.** සිතියම් ප්‍රදේශයේ ජනාවාස ව්‍යාප්ති රටාවේ හඳුනාගත හැකි ලක්ෂණ **තුනක්** නම් කරන්න. (ලකුණු 03)
- **viii.** **J** සිට **K** දක්වා හරස්කඩක් අඳින්න. (ලකුණු 04)
- **ix.** සිතියම් ප්‍රදේශයේ භෞතික ලක්ෂණ හා බෝග වගාව අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 05)

**2. සම්මත සංකේත හා වර්ණ** යොදාගනිමින් මතු සඳහන් දෑ සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි **ලකුණු කර නම් කරන්න.**

- **i.** මිසිසිපි ගඟ
- **ii.** ඇටකාමා කාන්තාරය
- **iii.** තායිවානය
- **iv.** ටොංගා ආගාධය
- **v.** මලාවි විල
- **vi.** ඇපිනයින් කඳු
- **vii.** කුක් සමුද්‍ර සන්ධිය
- **viii.** බැරන්ට්ස් මුහුද
- **ix.** 2024 ඔලිම්පික් තරගාවලියේ සත්කාරක නගරය
- **x.** 2024 මැයි මස ගුවන් අනතුරකින් මියගිය ජනාධිපතිවරයාගේ රට (ලකුණු 10)

## III කොටස

**3.** i. ද්විතීයික දත්ත මූලාශ්‍ර **තුනක්** නම් කරන්න. (ලකුණු 03)

**ii.** භූ ලක්ෂණ සිතියමක හා තේමා සිතියමක ප්‍රයෝජන **දෙක** බැගින් දක්වන්න. (ලකුණු 04)

**iii.** දත්ත සංවිධානයේ දී භාවිත වන ක්‍රම **දෙකක්** දක්වා, ඒ මගින් දත්ත සංවිධාන කටයුතුවලට ඇති ප්‍රයෝජන එක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

**iv.** භූගෝල විද්‍යාත්මක තොරතුරු සන්නිවේදනයේ දී සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රම ශිල්ප පිටුවහලක් වන ආකාරය පහත ක්ෂේත්‍ර ඇසුරින් විමසන්න.


**a.** කාලගුණ පුරෝකථන

**b.** සංවර්ධන ව්‍යාපෘති (ලකුණු 04)

**4. i.** දූරස්ථ සංවේදය (Remote Sensing) යන්න නිවැරදි ව අර්ථ දක්වන්න. (ලකුණු 02)

**ii.** දූරස්ථ සංවේද වේදිකා වර්ග **තුන** නම් කර ඒවාට උදාහරණ **එක** බැගින් දක්වන්න. (ලකුණු 03)

**iii.** මෙම රූප සටහනේ A හා B අක්ෂරවලින් දක්වා ඇති අවස්ථාවල සිදුවන ක්‍රියාවලි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)




**iv.** ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා දූරස්ථ සංවේද තාක්ෂණය භාවිත කළ හැකි අවස්ථා **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06)

**5.** 2022 මහ බැංකු වාර්තාවෙන් උපුටා ගත් ශ්‍රී ලංකාවෙන් රටවල් කිහිපයකට සිදු කෙරුණු තේ අපනයන ප්‍රමාණයන් ඇසුරෙන් සකස් කළ වගුවක් පහත දැක්වේ. එය පදනම් කොට ගනිමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**වගුව 1 : රටවල් අනුව සිදු කෙරුණු තේ අපනයන ප්‍රමාණයන් (කිලෝග්‍රෑම් දහස්) - 2022**

| **පන්ති ප්‍රාන්තර** (කිලෝග්‍රෑම් දහස්) | **සංඛ්‍යාතය** |
|---|---|
| 0 - 1999 | 08 |
| 2000 - 3999 | 06 |
| 4000 - 5999 | 03 |
| 6000 - 7999 | 05 |
| 8000 - 9999 | 03 |
| 10000 - 11999 | 03 |
| 12000 - 13999 | 02 |

මූලාශ්‍රයː මහ බැංකු වාර්තාව - 2022

**i.** ඉහත දත්ත පදනම් කොට ගනිමින් **සමුච්චිත සංඛ්‍යාත වක්‍රයක් (ඔගිවිය)** ගොඩනගන්න. (ලකුණු 08)

**ii.** ශ්‍රී ලංකාවේ තේ අපනයනයේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** ඔබ නිර්මාණය කළ සමුච්චිත සංඛ්‍යාත වක්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

**iii.** දත්ත විශ්ලේෂණයේ දී සමුච්චිත සංඛ්‍යාත වක්‍රය ප්‍රයෝජනවත් වන ආකාර **තුනක්** දක්වන්න. (ලකුණු 03)

**6.** වගුව 2 හි දක්වා ඇත්තේ 2022 මහ බැංකු වාර්තාවෙන් උපුටා ගත් දත්ත ඇසුරින් සකස් කළ වගුවකි. ඒ ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**වගුව 2 : ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන කිහිපයක ප්‍රමාණය (මෙට්‍රික් ටොන් දහස්)**

| වර්ෂය / ශීර්ෂය | 2018 | 2019 | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|---|
| **තිරිඟු** | 1297 | 1359 | 1484 | 1307 | 583 |
| **බොරතෙල්** | 1674 | 1842 | 1404 | 1182 | 649 |
| **සීනි** | 645 | 556 | 683 | 582 | 460 |
| **පොහොර** | 861 | 707 | 952 | 412 | 363 |

මූලාශ්‍රයඃ මහ බැංකු වාර්තාව - 2022


**i.** ඉහත දත්ත ඇසුරෙන් **බහු තීරු ප්‍රස්තාරයක්** නිර්මාණය කරන්න. (ලකුණු 08)

**ii.** ඔබ නිර්මාණය කළ ප්‍රස්තාරය ඇසුරෙන් 2018 සිට 2022 දක්වා ශ්‍රී ලංකාවේ ආනයන පරිමාවේ කැපී පෙනෙන කාලීන ලක්ෂණ **තුනක්** දක්වන්න. (ලකුණු 03)

**iii.** බහු තීරු ප්‍රස්තාර සහ බහු රේඛා ප්‍රස්තාර නිර්මාණයේ සමාන ලක්ෂණ **දෙකක්** සහ වෙනස්කම් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

❋❋❋❋

22 | I


A
A
B
C
D
E
F
G
J
K
B 3
B 8
Yatadolawatta
Puhambugoda
Yatadola
Pantiya
PANTIYA
CLEY
SILVERDALE
ARATOTA
Palligoda
Tattowita
Willegoda
Palligoda (Part)
Fuel Filling Station
Matugama East
Matugama West
Matugama (Part)
Bus Stand
ST. GEORGE'S GROUP
Palligoda (Part)
Yatiyana
ST. MARK
Wanduruabba
Wandurabba
NIVITIGALAKELE
Cemetery
Pinnagoda
Bodiyakanda
Owitigala (Part)
Malaboda
MALABODA
ST. EDWARD'S
Yatadolawatta
MADDAGEDERA
Narawila
Bopitiya
Welikumbura
Karampetara
ST GEORGE'S GROUP
PENIGALAKANDA
KABARAGALA
Owitigala (Part)
Badugama (Part)
NAYABINDUNUHENA KANDA
Pinnagoda
Owitigala
SIRIKANDURA
WERABOTALE
YATADOLA
Narawila
NARAWILA
MADDAGEDERA
MATUGAMA DIVISION
(PASDUN KORALE WEST)
Nawuttuduwa / Keerantidiya
Aluthgarogoda
Eladuwa
DODANGODA DIVISION
Keeranthidiya
Nawuttuduwa
NAWUTTUDUWA
KOTAGEDARA
PALLAGODDE
Narawila
Parawala
Badugama
BADUGAMA
CLARENCE HILL
MUKALANA GROUP
Hiriweddala
ST. COLUMBKILLE
Henegama
PERAGAHAHENA
PARAWALA
Horawala
IDALKETIYA
Cemetery
DENISTON
Horawala
Maha Kalupahana
Pallegoda
Kotagedara
Welipenna East
Gafasgama
Horawala
HORAWALA
Kolehakada
Dikpita
Welipenna East
UGGALKANDA
PALLAGODDE
Welipenna West
Henpita
DIKPITIYA
Welipenna West
Madawala
ROLLINGBOURNE
MEEGAMA
ST. COLUMBKILLE
Lewwanduuwa
Leeniyawa

1:50,000

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024

## අනුහුරු ප්‍රශ්න පත්‍රය

ප්‍රශ්න අංකය : 2



# අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා සමාජ විද්‍යා ශාඛාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024
## අනුහුරු ප්‍රශ්න පත්‍රය

| | | | | |
|---|---|---|---|---|
| භූගෝල විද්‍යාව II | 22 | S | II | |
| පැය තුනයි | | | | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 |

**උපදෙස්:**


❋ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.


## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

**(01).** i). මැග්මා ඝනීභවනය වන ස්ථානය අනුව නිර්මාණය වන ප්‍රධාන යමහල් භූ රූප වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 2)

ii). ඉහත ඔබ නම් කළ භූ රූප වර්ග දෙකට අදාළ භූ රූප **හතරක** නිර්මාණ ක්‍රියාවලිය රූපසටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

iii). පහත (A) හා (B) ලෙස දැක්වෙන්නේ ග්ලැසියර් ආශ්‍රිත භූ රූප දෙකකි.




a). ඉහත (A) හා (B) භූ රූප නිර්මාණයට හේතුවන **ඛාදන ස්වරූප දෙක** නම් කරන්න. (ලකුණු 2)

b). එම භූ රූප **දෙක** පිළිවෙළින් නම් කර, ඒවා නිර්මාණය වන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv). ග්ලැසියර් භූ දර්ශන ආර්ථික කටයුතු සඳහා භාවිත කරන ආකාර **තුනක්** නිදසුන් සහිත ව විස්තර කරන්න. (ලකුණු 6)

**(02).** i). චලනයේ ස්වභාවය අනුව නායයෑම් වර්ග **දෙකක්** දක්වන්න. (ලකුණු 2)

ii). නායයෑම් ඇතිවීමට බලපාන භෞතික හා මානුෂ සාධක අතර ඇති සබඳතාවන් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 6)

iii). නායයෑම් ආපදාව කළමණාකරණය කර ගැනීම සඳහා ආපදා කළමනාකරණ චක්‍රයේ අවස්ථා **තුනක්** යොදාගත හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 6)


iv). ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකවන ආපදා කළමනාකරණ යාන්ත්‍රණය විධිමත් කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග **දෙකක්** යෝජනා කර පැහැදිලි කරන්න. (ලකුණු 6)

**(03).** i). 'කාලගුණික මූලිකාංග' යනු කුමක් දැයි හඳුන්වන්න. (ලකුණු 2)

ii). කාලගුණික මූලිකාංග **තුනක** ක්‍රියාකාරිත්වය කෙරෙහි උෂ්ණත්වය බලපාන ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 6)

iii) a). මෙම සිතියමේ (A) හා (B) ලෙස නම් කර ඇති දේශගුණ කලාප **දෙක** පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 2)

b). එම (A) හා (B) දේශගුණ කලාප නිර්මාණය වීම කෙරෙහි බලපෑ දේශගුණ පාලන සාධක **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 4)




iv). ගෝලීය දේශගුණ වෙනස්වීම් ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රවලට බලපාන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 6)

**(04).** i). සෞම්‍ය කලාපීය වනාන්තර බියෝමය දක්නට ලැබෙන නැගෙනහිර ආසියාතික රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 2)

ii). ලෝකයේ මධ්‍යධරණී බියෝමය සහිත ප්‍රදේශවල කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 6)

iii). කාන්තාර හා තුන්ද්‍රා බියෝමයන් දේශගුණයට අනුවර්තනය වීමේ දී දැකිය හැකි සමාන ලක්ෂණ **තුනක්** සංසන්දනාත්මක ව පැහැදිලි කරන්න. (ලකුණු 6)

iv). කාන්තාර හා මධ්‍යධරණී දේශගුණය ආශ්‍රිත මානව ක්‍රියාකාරකම්වල මෑත කාලීන වෙනස්කම් **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

## <u>II කොටස - මානුෂ භූගෝල විද්‍යාව</u>

**(05).** i). 'අවතැන්වීම' සහ 'සරණාගතවීම' යන්නෙහි අර්ථයන් වෙන වෙන ම දක්වන්න. (ලකුණු 2)

ii). වයඹ දිග යුරෝපා කලාපය හා නැගෙනහිර ආසියානු කලාපය ලෝකයේ ප්‍රධාන ජන සංකේන්ද්‍රණ බවට පත් වීමට බලපෑ ජන විද්‍යාත්මක සාධක **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 6)

iii). ශ්‍රී ලංකාව තුළ සිදු වූ අභ්‍යන්තර සංක්‍රමණ ප්‍රාදේශීය සංවර්ධනයට හේතු වූ ආකාරය නිදසුන් සහිත ව විස්තර කරන්න. (ලකුණු 6)

iv). වර්තමානයේ සංවර්ධිත රටවල් විසින් සංක්‍රමණ සීමා කිරීමට හේතු විය හැකි සාධක **තුනක්** විස්තර කරන්න. (ලකුණු 6)

**(06).** i). 'ගෝලීයකරණය' යන්න කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 2)

ii). ගෝලීයකරණයේ ගති ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 6)

iii). ගෝලීයකරණ ක්‍රියාවලියේ දී බහු ජාතික සමාගම්වල කාර්යභාරය කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 6)

iv). ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි ගෝලීයකරණයේ හිතකර හා අහිතකර බලපෑම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 6)

**(07).** i). ජනාවාසයක අත්‍යවශ්‍යයෙන් ම පැවතිය යුතු අංග **හතරක්** නම් කරන්න. (ලකුණු 2)

ii) a). කාර්යය හා ස්වභාවය අනුව ජනාවාස වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 2)


b). ඉහත (a) හි නම් කළ එක් ජනාවාස වර්ගයක ගති ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii) a). ලෝක නාගරික ජන සංඛ්‍යාවේ කාලික විචලනය (සක් සටහනෙහි තද කළු පැහැයෙන්) දක්වා ඇති මෙම සටහන මගින් අනාවරණය කර ගත හැකි කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 2)


b). ලෝක නාගරීකරණයෙහි මෑත කාලීන සුවිශේෂතා **දෙකක්** සාකච්ඡා කරන්න. (ලකුණු 4)

iv). ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ගැටළු විසඳීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 6)

**ලෝක නාගරික ජන සංඛ්‍යාවේ කාලික වෙනස්වීම**




**(08).** i). ලෝකයේ කර්මාන්තවල ප්‍රධාන බෙදීම් දක්වා ඇති මෙම ගැලීම් සටහනෙහි A, B, C හා D නිවැරදි ව පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 2)




ii). කර්මාන්ත ස්ථානගත වීමට බලපෑ සාම්ප්‍රදායික සාධකවලට වඩා වර්තමානයේ සුවිශේෂී වන සාධක **තුනක** යෝග්‍යතාවය නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

iii). ශ්‍රී ලංකාවේ ආකර කර්මාන්තය රටේ ආර්ථික සංවර්ධනයට බලපාන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 6)

iv). වර්තමානයේ පසුබෑමට ලක් වී ඇති ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රය නගා සිටුවීමට සුදුසු ක්‍රියාමාර්ග **තුනක්** යෝජනා කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 6)

❋ ❋ ❋ ❋

# අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා සමාජ විද්‍යා ශාඛාව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024
## අනුහුරු ප්‍රශ්න පත්‍රය - පිළිතුරු පත්‍රය

## භූගෝල විද්‍යාව I

### I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 11 | 5 | 21 | 3 | 31 | 3 |
| 02 | 1 | 12 | 2 | 22 | 5 | 32 | 5 |
| 03 | 5 | 13 | 4 | 23 | 1 | 33 | 1 |
| 04 | 2 | 14 | 1 | 24 | 4 | 34 | 2 |
| 05 | 4 | 15 | 3 | 25 | 2 | 35 | 4 |
| 06 | 2 | 16 | 4 | 26 | 5 | 36 | 3 |
| 07 | 1 | 17 | 5 | 27 | 2 | 37 | 4 |
| 08 | 5 | 18 | 1 | 28 | 3 | 38 | 1 |
| 09 | 4 | 19 | 2 | 29 | 1 | 39 | 5 |
| 10 | 3 | 20 | 3 | 30 | 4 | 40 | 2 |

### II කොටස

1).

i. නෙරුව **(ලකුණු 1)**

ii. ග්‍රාම නිලධාරි කොට්ඨාස මායිම **(ලකුණු 1)**

iii. වනාන්තර **(ලකුණු 1)**

iv. E අක්ෂරයෙන් **(ලකුණු 1)**


v. පාසල, තැපැල් කාර්යාලය, තානායම, ඉන්ධන පිරවුම් හල **(ලකුණු ½ බැගින් - ලකුණු 2)**

vi. සිතියම මුද්‍රණය කරන විට පරිමාණය වෙනස් විය හැකි බැවින් ගණනය කර ලකුණු දෙන්න **(ලකුණු 2)**

vii.
- සිතියම් ප්‍රදේශය පුරා ජනාවාස ව්‍යාප්ත වී ඇත
- විකීර්ණ/මංසන්ධි/රේඛීය/පොකුරු ජනාවාස (ආකීර්ණ) සියල්ල ම සිතියම් ප්‍රදේශයේ ව්‍යාප්ත ව ඇත
- මාර්ග එකිනෙක හමුවන ස්ථාන ආශ්‍රිත ව මංසන්ධි ජනාවාස (පොකුරු ජනාවාස) දැකිය හැකිය
- උස්බිම් ආශ්‍රිත ව විසිරි (විකීර්ණ ජනාවාස) දැකිය හැකිය
- අනෙක් ප්‍රදේශවලට සාපේක්ෂ ව ප්‍රධාන/අප්‍රධාන මාර්ග දෙපස ජනාවාස ව්‍යාප්තිය ඉහළ ය
- තැනින් තැන පොකුරු ජනාවාස දැකිය හැකිය

**(ලක්ෂණ තුනක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 3)**

viii. හරස්කඩ නිවැරදි ව ඇඳ ඇත්නම්



**(ලකුණු 4)**


ix. **- උස්බිම් ආශ්‍රිත ව**
- රබර් වගාව හා තේ වගාව දක්නට ලැබීම
- වනාන්තර ආශ්‍රිත ව බෝග වගාව අවම ය

**- ගංගා හා අතු ගංගා ආශ්‍රිත ව**
- වී වගාව

**- පහත් බිම් (රළි බිම්) ආශ්‍රිත ව**
- ගෙවතු - පොල් වගාව - වී වගාව
- සමහර ප්‍රදේශවල රබර් හා තේ වගාව ද

**(භෞතික ලක්ෂණ හා බෝග වගාව අතර සම්බන්ධතාව නිවැරදි ව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කර ඇත්නම් ලකුණු 4**
**කටුසටහන් භාවිතයට ලකුණු 1**
**ලකුණු 5)**

2). පිළිතුරු සිතියම




**(ලකුණු 1 බැගින් - ලකුණු 10)**

## III කොටස

3. i.
- අන්තර්ජාලය
- පුස්තකාලය
- සිතියම්
- ගුවන් ඡායාරූප
- වාර්තා
- චන්ද්‍රිකා ප්‍රතිබිම්බ
- ප්‍රස්තාර
- පින්තූර හා ඡායාරූප ආදිය

**(මූලාශ්‍ර තුනක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 03)**

ii. **<u>තේමා සිතියම්වල ප්‍රයෝජන</u>**
- එක් තේමාවක් පිළිබඳ දැක්වෙන සුවිශේෂත්වය
- එක් ප්‍රදේශයක එක් තේමාවක් දෙස සමස්තයක් ලෙස බැලීමේ හැකියාව (එක් රටක හෝ ලෝකයේ හෝ තොරතුරු)
- එක ම තේමාවක් දැක්වෙන සිතියම් කීපයක් මඟින් කාලික වෙනස්කම් නිරූපණය කිරීමේ හැකියාව
- කුඩා පරිමාණයේ සිතියමක් නිසා පරිහරණයේ පහසුව

**<u>භූ ලක්ෂණ සිතියම්වල ප්‍රයෝජන:</u>**
- ප්‍රදේශයේ භූ ලක්ෂණවල අවකාශීය ව්‍යාප්තිය පැහැදිලි ව කියවීමට හැකි වීම
- කිසියම් ස්ථානයක සාපේක්ෂ පිහිටීම හා නිරපේක්ෂ පිහිටීම නිවැරදි ව ප්‍රකාශ කිරීමේ හැකියාව
- භූ ලක්ෂණ අතර ඇති සම්බන්ධතාව පැහැදිලි ව තේරුම් ගැනීමට හැකි වීම
- රටක හෝ ප්‍රදේශයක හෝ සංවර්ධන හා සැලසුම් කටයුතු සඳහා යොදා ගැනීමට හැකි වීම

**(භූ ලක්ෂණ සිතියමක ප්‍රයෝජන දෙකක් දැක්වීමට ලකුණු 1 බැගින් ලකුණු 2**
**තේමා සිතියමක ප්‍රයෝජන දෙකක් දැක්වීමට ලකුණු 1 බැගින් ලකුණු 2**
**ලකුණු 04)**

iii. දත්ත වැල, දත්ත වගු

**(ක්‍රම දෙක නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)**

**<u>දත්ත වැල:</u>**
- සරල ක්‍රමවේදයක් වීම
- දත්ත වගුගත කිරීමට පහසු වීම
- කාලය අඩු වීම
- විශ්ලේෂණ කටයුතුවල දී දත්ත මගහැරීමට ඇති සම්භාවිතාව අඩු වීම
- කුඩා දත්ත ව්‍යාප්තියක් දත්ත වැල ඇසුරින් දත්ත විශ්ලේෂණය පහසු වීම

**<u>දත්ත වගු:</u>**
- දත්ත විවරණයට පහසු වීම
- දත්ත හඳුනාගැනීමට පහසු වීම
- දත්ත් විශ්ලේෂණයට අවශ්‍ය පසුබිම සැලසීම
- විශාල දත්ත ප්‍රමාණයක් විශ්ලේෂණය කළ හැකි වීම
- දත්ත ප්‍රදර්ශනය පහසු වීම

**(එක් ක්‍රමයකින් ප්‍රයෝජන එක බැගින් නම් කිරීමට ලකුණු 1 බැගින් ලකුණු 2)**
**(ලකුණු 4)**

iv. <u>කාලගුණ අනාවැකි:</u>
-දත්ත විශ්ලේෂණය: ප්‍රවණතා, රටා සහ විෂමතා හඳුනා ගැනීමට ඓතිහාසික කාලගුණ දත්ත විශ්ලේෂණය කිරීමට සංඛ්‍යානමය ක්‍රම උපකාරී වේ. මෙම විශ්ලේෂණය අනාගත කාලගුණික තත්ත්වයන් පුරෝකථනය කිරීම සඳහා පදනම සාදයි.

-අනාවැකි ආකෘතිකරණය: උෂ්ණත්වය, වර්ෂාපතනය, සුළං වේගය යනාදී කාලගුණ පරාමිතීන් පුරෝකථනය කිරීමට ප්‍රතිගාමී විශ්ලේෂණය, කාල ශ්‍රේණි විශ්ලේෂණය සහ යන්ත්‍ර ඉගෙනුම් ඇල්ගොරිතම වැනි ශිල්පීය ක්‍රම යෙදිය හැක.

-දෘශ්‍යකරණය: සංඛ්‍යානමය සාරාංශ සහ දෘශ්‍යකරණයන් (උදා: ප්‍රස්ථාර, සිතියම්) සංකීර්ණ කාලගුණ දත්ත මහජනතාවට සහ තීරණ ගන්නන්ට තේරුම් ගත හැකි ආකෘතියකින් ඉදිරිපත් කිරීමට උපකාරී වේ.

-අවිනිශ්චිතතා ප්‍රමාණකරණය: සංඛ්‍යානමය ක්‍රම මගින් කාලගුණ විද්‍යාඥයින්ට කාලගුණ අනාවැකි හා සම්බන්ධ අවිනිශ්චිතතාවය ප්‍රමාණ කිරීමට ඉඩ සලසයි, විවිධ කාලගුණ ප්‍රතිඵලවල සම්භාවිතාව ප්‍රකාශ කරන සම්භාවිතා අනාවැකි සපයයි.

-සත්‍යාපනය: කාලගුණ අනාවැකිවල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය සත්‍යාපනය කිරීමට සංඛ්‍යාන ශිල්පීය ක්‍රම භාවිතා කරයි, අනාවැකි ආකෘති වැඩිදියුණු කිරීම සඳහා නිරීක්ෂිත දත්ත සමඟ පුරෝකථනය කරන ලද ප්‍රතිඵල සංසන්දනය කරයි.

<u>සංවර්ධන ව්‍යාපෘති:</u>
-අවදානම් තක්සේරුව: සංඛ්‍යාලේඛන ක්‍රම මගින් ජනවිකාස, ආර්ථික විද්‍යාව, පාරිසරික සාධක ආදියට අදාළ අවකාශීය දත්ත විශ්ලේෂණය කිරීමෙන් සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධ අවදානම් තක්සේරු කරයි.

-බලපෑම් ඇගයීම: සංඛ්‍යාලේඛන ශිල්පීය ක්‍රම භාවිතයෙන් අධ්‍යයනයට පෙර සහ පසු ප්‍රජාවන් සහ පරිසරයන් මත සංවර්ධන ව්‍යාපෘතිවල බලපෑම ඇගයීමට උපකාරී වේ.

-අවකාශීය විශ්ලේෂණය: භූගෝලීය තොරතුරු පද්ධති (GIS) සහ සංඛ්‍යානමය ක්‍රම මගින් අවකාශීය විශ්ලේෂණය, යටිතල පහසුකම් සඳහා ප්‍රශස්ත ස්ථාන හඳුනා ගැනීම, ප්‍රවේශ්‍යතාව තක්සේරු කිරීම සහ සම්පත් වෙන් කිරීම සැලසුම් කිරීම සක්‍රීය කරයි.

-සම්පත් වෙන් කිරීම: ජනගහනයේ අවකාශීය ව්‍යාප්ති රටා සහ ජනවිකාස ලක්ෂණ විශ්ලේෂණය කිරීමෙන් සම්පත් කාර්යක්ෂමව වෙන් කිරීමට සංඛ්‍යාන ආකෘති නිර්මාණය උපකාර කරයි.

-මහජන සහභාගීත්වය: සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිලාභ සහ අභියෝග පාර්ශ්වකරුවන්ට සහ සාමාන්‍ය ජනතාවට සන්නිවේදනය කිරීමට, දැනුවත් තීරණ ගැනීමට පහසුකම් සැලසීමට සංඛ්‍යානමය සාරාංශ සහ දෘශ්‍යකරණය උපකාරී වේ.

**(ක්ෂේත්‍ර දෙක සඳහා ලකුණු 2 බැගින් - ලකුණු 04)**

**04. i.** කිසියම් වස්තුවක් හෝ ක්‍රියාකාරිත්වයක් හෝ වෙත භෞතික ව ළඟා නොවී දුර සිට හඳුනා ගැනීම, අධ්‍යයනය කිරීම, වටහා ගැනීම හා විශ්ලේෂණය කිරීමේ තාක්ෂණය දූරස්ථ සංවේදය යි.

**(මෙවැනි නිවැරදි අර්ථ දැක්වීමකට ලකුණු ලබා දෙන්න - ලකුණු 02)**

**ii.** - **භූමි පාදක වේදිකා :** වාහනයක සවිකළ දොඹකර, උස් ස්ථානයක්/ගොඩනැගිල්ලක සවිකළ සංවේද උපකරණ කට්ටලයක්
- **වාසර වේදිකා :** ගුවන් යානා, හෙලිකොප්ටර්, බැලූන්, අහස් නැව්, ඩ්‍රෝන, නියමුවන් රහිත යානා (UAV) ආදිය
- **අභ්‍යවකාශ වේදිකා :** චන්ද්‍රිකා, රොකට්, අජටාකාශ යානා, අභ්‍යවකාශ මධ්‍යස්ථාන ආදිය

**(වේදිකාවක් නම් කිරීමට ලකුණු ½**
**උදාහරණයක් දැක්වීමට ලකුණු ½**
**x 3**
**ලකුණු 03)**

**iii. A - වස්තුව/ඉලක්කගත වස්තුව (Target)**
**-** ශක්ති මූලයක් මගින් ප්‍රදීපනය වී ශක්තිය අවශෝෂණය කර විමෝචනය හෝ පරාවර්තනය කරයි. පෘථිවිය මත ඇති වස්තූන් මගින් පරාවර්තනය කරන ශක්තිය වස්තුවේ ස්වභාවය, සූර්යාලෝකය පතනය වන කෝණය, වේලාව, කාලගුණික තත්ත්වය මත රඳා පවතී.
**B - සංවේදකය (Sensor)**
- පෘථිවිය මත ඇති වස්තූන් මගින් පරාවර්තනය කරන ශක්තිය ග්‍රහණය කර ගැනීම සිදු කරයි. පරාවර්තනය කරන ශක්තිය භෞතික අනුරූප හෝ අංකිත දත්ත ලෙස මධ්‍යස්ථානය වෙත සම්ප්‍රේෂණය කිරීම කරනු ලබයි.


**(නිවැරදි ව නම් කිරීමට ලකුණු ½ + විස්තරයට ලකුණු 1 ½ බැගින් x 2**
**ලකුණු 04)**

**iv.** - වසංගත රෝග ව්‍යාප්ත ප්‍රදේශවල තොරතුරු ලබා ගැනීම
- ආපදා අවස්ථාවන්වල දී, අවස්ථාවෙන් පසු එම ප්‍රදේශ නිරීක්ෂණය කිරීම
- ආපදා ප්‍රදේශ සිතියම්ගත කිරීම
- ප්‍රජාව දැනුම්වත් කිරීම
- සහන සේවා සැපයීම
- නැවත පදිංචි කරවීම්, පොදු පහසුකම් අලුත්වැඩියා කිරීම් ආදිය

**(මෙවැනි අවස්ථා තුනක් නිවැරදි ව පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 06)**

5. i.

| පන්ති ප්‍රාන්තර (Kg දහස් ) | සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත ප්‍රතිශත සංඛ්‍යාතය % |
|---|---|---|---|
| 0 - 1999 | 08 | 08 | 37.5 |
| 2000 - 3999 | 06 | 14 | 46.6 |
| 4000 - 5999 | 03 | 17 | 56.6 |
| 6000 - 7999 | 05 | 22 | 73.3 |
| 8000 - 9999 | 03 | 25 | 83.3 |
| 10000 - 11999 | 03 | 28 | 93.3 |
| 12000 - 13999 | 02 | 30 | 100 |




**(සමුච්චිත සංඛ්‍යාතය සෙවීමට ලකුණු 1**
**සිරස් හා තිරස් අක්ෂ දෙක නම් කිරීමට ලකුණු 1 බැගින් ලකුණු 2**
**මාතෘකාව හා මූලාශ්‍රය නම් කිරීමට ලකුණු ½ බැගින් ලකුණු 1**
**ඔගීව් වක්‍රය නිවැරදි ව ඇඳීමට ලකුණු 4**
**ලකුණු 08)**

ii. ඔගිව් ප්‍රස්තාරයට අනුව,

- තේ අපනයනය කරන රටවල් අතරින් 50% ක් අපනයනය කර ඇත්තේ 4000kg ට අඩුවෙනි.
- 8000kg ට වඩා අඩු ප්‍රමාණයක් අපනයනය කර ඇත්තේ 75% ට වඩා අඩු රටවල් ප්‍රමාණයකට ය.
- 10000kg ට වඩා අඩු ප්‍රමාණයක් අපනයනය කර ඇත්තේ 82% ට වඩා අඩු රටවල් ප්‍රමාණයකට ය.


**(යනාදී වශයෙන් නිවැරදි ව ලක්ෂණ දෙකක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 04)**

iii. - දත්ත පරාසයේ ඕනෑම අගයක් දක්වා ඇති සංඛ්‍යාතය ප්‍රස්තාරික ව ලබා ගැනීමේ හැකියාව

- මෙම ප්‍රස්තාරයට අනුව x අක්ෂයේ සිට අඳිනු ලබන සිරස් රේඛාව ඔගිව් ප්‍රස්තාරය ස්පර්ශ වන ස්ථානවලින් තිරස් රේඛාවලින් y අක්ෂයට යා කිරීමෙන් විවිධ ප්‍රතිශත අගයට අදාළව සංඛ්‍යාත අගයන හොඳින් තේරුම් ගත හැකි වීම
- විචල්‍යයේ දත්ත සන්සන්දනය කළ හැකි වීම / සන්සන්දනය සඳහා යෝග්‍ය වේ
- දත්ත ව්‍යාප්තියේ මධ්‍යස්ථය (Q2) හා Q1 හා Q3 යන අගයන් හඳුනාගත හැකි වීම
- මධ්‍යස්ථයට අනුව ඔගීව් වක්‍රය තුළින් මධ්‍යස්ථයයට ඉහළ සහ මධ්‍යස්ථයට පහළ අගයන්වල වටිනාකම් සන්සන්දනය කළ හැක
- වඩා වැඩි හා වඩා අඩු ඔගීව් වක්‍ර දෙකක් නිර්මාණය කිරීමේ හැකියාව

**(ප්‍රයෝජන තුනක් දැක්වීමට ලකුණු 1 බැගින් - ලකුණු 03)**

6. i.




**(තිරස් සිරස් අක්ෂ දෙක ලකුණු කර නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2**

**මාතෘකාව හා මූලාශ්‍රය දැක්වීමට ලකුණු ½ බැගින් - ලකුණු 1**

**සූචකය දැක්වීමට ලකුණු 1**

**තීරු නිවැරදි ව ඇඳ දැක්වීමට (වර්ණ හෝ රටාවන් සහිත ව) ලකුණු 4**

**ලකුණු 08)**

ii. **මෙහි පිළිතුරු <u>කාලීන ලක්ෂණවල වෙනස්කම්වලට අනුව</u> සඳහන් කර තිබිය යුතුය. ශීර්ෂවල වෙනස්කම් (බොරතෙල්, තිරිඟු, සීනි, පොහොර යනාදියේ) අදාළ නොවේ**

- තිරිඟු ආනයනය ප්‍රමාණයන් 2018-2020 දක්වා ක්‍රමයෙන් වැඩි වී ඇති අතර 2021 දී තරමක අඩු වීමක් හා 20022 වර්ෂයේ අඩකටත් වඩා අඩු වීමක් හඳුනාගත හැකිය
- බොරතෙල් ආනයන පරිමාවන් 2019 වර්ෂයේ වැඩි අතර 2020-2022 දක්වා ක්‍රමයෙන් අඩු වී ඇත
- 2018-2022 දක්වා සීනි ආනයන ප්‍රමාණයේ සුළු වෙනසකින් අඩු වැඩි වෙමින් පවතී
- 2020න් පසු පොහොර ආනයන ප්‍රමාණය කැපී පෙනෙන ලෙස අඩු වී ඇත
- සමස්තයක් ලෙස 2018-2022 කාලය තුළ වැඩි ම ආනයන ප්‍රමාණය බොරතෙල් හා අඩු ම ආනයන ප්‍රමාණය සීනිවලින් හඳුනාගත හැකිය

**(කැපී පෙනෙන කාලීන ලක්ෂණ තුනක් දැක්වීමට ලකුණු 1 බැගින් - ලකුණු 03)**

iii. **<u>සමාන ලක්ෂණ</u>**

- බහු රේඛා ප්‍රස්තාරයේ හා බහු තීරු ප්‍රස්තාරයේ y අක්ෂය කාණ්ඩකර ගැනීමේ දී පොදුවේ විචල්‍යයන් සියල්ලගේ ම අවම අගය හා උපරිම අගය නියෝජනය වන පිරිදි සකසා ගැනීම
- ප්‍රස්තාර දෙකේ ම සිරස් අක්ෂයේ පරිමාණය හැමවිටම ශුන්‍යයෙන් ආරම්භ වීම
- ප්‍රස්තාර දෙකේ ම ඇතැම් විට අගයන් විශාල නම් y අක්ෂයේ 0 සිට ඛණ්ඩ කර දැක්වීම
- ප්‍රස්තාර දෙකේ ම තිරස් අක්ෂ ආරම්භයේ සහ අවසානයේ පරතරවලට සමාන ඉඩක් තැබීම
- ප්‍රස්තාර මූලිකාංග ප්‍රස්තාර දෙකේ ම අන්තර්ගත වීම

**<u>වෙනස්කම්</u>**

- බහු රේඛා ප්‍රස්තාරයේ විචල්‍යය වෙනස්කම් තිරස් රේඛා ආශ්‍රයෙන් නිරූපණය කර ඇත. බහු තිරු ප්‍රස්තාරයේ සිරස් තීරු ආශ්‍රයෙන් නිරූපණය කර ඇත.
- තිරස් අක්ෂයේ කාලය අනුව වර්ෂවලට අදාළ තීරු කාණ්ඩ අතර පරතරයක් ඇත. නමුත් බහු රේඛා ප්‍රස්තාරයේ තිරස් අක්ෂයේ වර්ෂ අතර පරතරයක් නොමැත.
- තෝරාගත් විචල්‍ය කිහිපයක් වෙනස්කම් කාලය අනුව ප්‍රස්තාර දෙකේ ම නිරූපණය කර තිබීම.

**(සමාන ලක්ෂණ දෙකක් හා වෙනස්කම් දෙකක් සඳහා ලකුණු 1 බැගින් - ලකුණු 04)**

❋ ❋ ❋ ❋

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2024
අනුහුරු ප්‍රශ්න පත්‍රය - පිළිතුරු පත්‍රය

භූගෝල විද්‍යාව II

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

01).

i. - ආක්‍රාන්ත යමහල් භූ රූප
- නිෂ්ක්‍රාන්ත යමහල් භූ රූප

**(වර්ග දෙක නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)**

ii. - ආක්‍රාන්ත යමහල් භූ රූප
- ඩයික
- පාකොලිත
- ලොපොලිත
- ආස්තර
- ලැකොලිත
- බැතොලිත

- නිෂ්ක්‍රාන්ත යමහල් භූ රූප
- යමහල් කේතු
- යමහල් අළු කේතු
- සංයුක්ත කේතු
- කල්දේරාව
- ලාවා සානු
- ලාවා පේනු

**(එක් වර්ගයකින් භූ රූප දෙක බැගින් නිවැරදි ව ඇඳ විස්තර කිරීමට ලකුණු 1½ බැගින් x 4- ලකුණු 6)**

iii. a. A - උත්පාටනය
B - උල්ලේඛය

**(ඛාදන ස්වරූප දෙක නිවැරදි ව නම් කිරීමට ලකුණු ½ බැගින් - ලකුණු 1)**

b. **<u>සර්කය :</u>** කඳු ග්ලැසියර් ප්‍රදේශයක පහළට නිම්න ඔස්සේ ගමන් කරන ග්ලැසියරය මගින් නිම්නයේ ලිහිල් පාෂාණ ඇති ස්ථාන ගැඹුරට ඛාදනය කිරීමෙන්, උත්පාටන ක්‍රියාවලිය ප්‍රබල වී නිර්මාණය වන ආවාටයකි. මෙම භූ රූපයේ හරස්කඩ හාන්සි පුටුවක හැඩය ගනී. උදා: ස්කොට්ලන්තය හා වේල්සය

**<u>රොෂ්මුටොන්නේ :</u>** මහාද්වීප ග්ලැසියර් ක්‍රියාවලියේ දී ග්ලැසියර් ගලාගෙන යන විට තද පාෂාණ සහිත කුඩා කඳුකර ප්‍රදේශයක ගමන් කරන විට උල්ලේඛ ක්‍රියාවලිය නිසා ග්ලැසියර් මුහුණත මටසිලුටු ව ගෙවා දමන අතර, ග්ලැසියර් මුවාවේ ලිහිල් පාෂාණ අක්‍රමවත් ව ගෙවා දැමීමෙන් කඩතොළු සහිත ව නිර්මාණය වේ. එම භූ රූපයේ හැඩය ප්‍රංශ ජාතිකයක්ගේ තොප්පියකට සමාන බැවින් රොෂ්මුටෙන්නේ ලෙස නම් කරයි. උදා: ඇලස්කාව, ග්‍රීන්ලන්තය, ස්කොට්ලන්තය

**(භූ රූප දෙක නිවැරදි ව නම් කිරීමට ලකුණු ½ බැගින් - ලකුණු 1**
**භූ රූප දෙක නිවැරදි ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 4**
**ලකුණු 6)**

iv. - **සංචාරක කර්මාන්තය** (නෝර්වේ, ස්වීඩනය, ෆින්ලන්තය)
- ලම්භ නිම්න ආශ්‍රිත දියඇළි
- හිම කඳු තරණය
- හිම ක්‍රීඩා කිරීම

- **කෘෂිකාර්මික කටයුතු** (නවසීලන්තය, ඩෙන්මාර්කය)
- අකුරු මැටි නිධි ආශ්‍රිත ව බෝග වගාව
- ග්ලැසියර් නිම්න වල තෘණ භූමිවල සත්ත්ව පාලන කටයුතු

- **ජල විදුලි නිෂ්පාදනය** (නෝර්වේ)
-ලම්භ නිම්න ආශ්‍රිත ව

- **කඩතොළු වෙරළ/ෆියෝඩ වෙරළ ප්‍රදේශවල** (එක්සත් රාජධානිය, නෝර්වේ)
- ධීවර කර්මාන්තය
- නැව් කර්මාන්තය

**(ආර්ථික කටයුතු සඳහා භාවිත කරන ආකාර තුනක් නිදසුන් සහිත ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

02). i. - රූරාව
- වැටීම්/ඇදහැලීම්
- රූටායාම/ලිහිටුම
- පෙරළීම්/ප්‍රපතනය
- ගැලීම්/දෝර

**(මින් දෙකක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)**

ii.

| භෞතික සාධකය | මානව බලපෑම් |
|---|---|
| බෑවුමේ ස්වභාවය | ගොඩනැගිලි, මාර්ග වැනි ඉදිකිරීම් සිදු කිරීම |
| පාෂාණ ව්‍යුහය | ගල්වලවල්, මැණික් පතල් ආදී භූගත කැණීම් කිරීම |
| අධික වර්ෂාපතනය/වර්ෂාපතන තීව්‍රතාව | අක්‍රමවත් බෝග වගාව, අයෝග්‍ය ඉදි කිරීම් |
| පාංශු හා භූගත ජලය | ජලාශ ඉදිකිරීම, වගා කටයුතු, ගොඩනැගිලි ඉදි කිරීම |

**මේවා අතර සබඳතාව පැහැදිලි කර තිබිය යුතුය**

**(සබඳතාවන් තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

iii. - **පෙර සූදානම**
- නායයෑම් පිළිබඳ අනාවැකි ප්‍රකාශ කිරීම
- නායයෑම් ඇති වීමට පෙර දේශගුණික වශයෙන් භූ දර්ශනය වෙනස් වී ම පිළිබඳ ව අවධානය යොමු කිරීම
- ජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

**- අවම කිරීම**
- නායයෑම් අනතුරු ප්‍රදේශවලින් ජනතාව ඉවත් කිරීම
- නායයෑම් අවදානම තක්සේරු කිරීම
- අවම කිරීමේ පූර්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආයතනික ශක්තිමත්භාවය ඇති කිරීම
- ආපදා හානි තක්සේරු කර ඒවාට පිළියම් ඉදිරිපත් කිරීම

**- ප්‍රතිචාර දැක්වීම**
- අනතුරු හැඟවීම හා ගලවා ගැනීම
- ආරක්ෂාව සහතික කිරීම
- ප්‍රතිකාර ලබා දීම
- හානි වූ දේපළ ඉවත් කිරීම
- තාවකාලික නිවාස හා ආහාරපාන සැපයීම
- අලාභහානි තක්සේරු කිරීම

**- යථා තත්ත්වයට පත් කිරීම**
- ආපදාවට ලක් වූ ජනතාවගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය මට්ටම් යථාවත් කිරීම
- හානි වූ නිවාස හා යටිතල පහසුකම් තාවකාලික ව මෙන් ම ස්ථිරව ගොඩනගා ගැනීමට වැඩපිළිවෙළක් සකස් කිරීම
- ජනතාවගේ ජීවන තත්ත්වය යථා තත්ත්වයට පත් කිරීම

**(අවස්ථා තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

iv. - ආපදා බහුල ප්‍රදේශවල කුඩා ආපදා කළමනාකරණ කමිටු පිහිටුවීම
- ආපදා කළමනාකරණ ක්‍රියාවලිය විධිමත් කිරීම
- දැනට සවිකර ඇති ආපදා අනතුරු සංඥා පද්ධති නඩත්තුව හා අලුත්වැඩියා කිරීම
- ආපදා ප්‍රදේශ සිතියම්ගත කිරීම, ඒවා ප්‍රසිද්ධියට පත් කිරීම
- ආපදා ප්‍රදේශවලින් ඉවත් නොවන අයවලුන් හට නීතිය ක්‍රියාත්මක කිරීම

**(ක්‍රියා මාර්ග දෙකක් යෝජනා කර පැහැදිලි කිරීමට ලකුණු 3 බැගින් - ලකුණු 6)**

03). i. උෂ්ණත්වය, වර්ෂණය, ආර්ද්‍රතාව, පීඩනය හා සුළං, දෘශ්‍යතාව, වලාකුළු ආදි අංග මුල් කරගෙන කිසියම් ස්ථානයක කිසියම් වේලාවක කාලගුණය තීරණය වේ. කාලීන හා ස්ථානීය කාලගුණ තත්ත්වය මෙම ලක්ෂණ මත පදනම් ව තීරණය වන බැවින් ඒවා කාලගුණයේ මූලිකාංග ලෙස හැඳින්වේ

**(යනාදි නිවැරදි පැහැදිලි කිරීමකට ලකුණු 2)**

ii. - උෂ්ණත්වය ඉහළ යාමේ දී පීඩනය අඩු වීම
- උෂ්ණත්වය ඉහළ ගොස් අඩු පීඩන කලාප නිර්මාණය වීමෙන් වැඩි කලාප හා අඩු පීඩන කලාප අතර සුළං සංසරණය වීම
- අඩු පීඩන කලාපවලට සුළං හමා ඒමෙන් වර්ෂණය ඇති වීම
- උෂ්ණත්ව සාධකය මත දෘශ්‍යතාව තීරණය වීම
- උෂ්ණත්ව සාධකය මත වාෂ්පීකරණ ක්‍රියාවලිය මත ආර්ද්‍රතාව වෙනස් වීම
- වලාකුළු නිර්මාණය සහ වලා වැස්ම කෙරෙහි උෂ්ණත්වය බලපෑම

**(යනාදි වශයෙන් කාලගුණික මූලිකාංග තුනක ක්‍රියාකාරිත්වය කෙරෙහි උෂ්ණත්වය බලපාන ආකාරය විස්තර කර ඇත්නම් ලකුණු 2 බැගින් - ලකුණු 6)**

iii. a. A - අර්ධ ශුෂ්ක කලාපය
B - කඳුකර වියළි කලාපය

**(කලාප දෙක නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)**

b. A - **අර්ධ ශුෂ්ක කලාපය**
- කඳු බාධක (වර්ෂාකාරක සාධක) දක්නට නොලැබීම
- පාංශු තත්ත්වයන් හා වන වැස්මේ ස්වභාවය වැනි සාධක

B - **කඳුකර වියළි කලාපය**
- මධ්‍ය කඳුකරය කඳු බාධයක් ලෙස ක්‍රියාකිරීම
- උන්නාංශය සමග සිදුවන උෂ්ණත්ව වෙනස්වීම්
- මධ්‍ය කඳුකරයේ බටහිර බෑවුමේ පිහිටා තිබීම නිසා වියළි සුළංවල බලපෑම වැනි සාධක

**(සාධකයක් බැගින් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 4)**

**(ලකුණු 6)**

iv. **කෘෂිකර්මය**
- දේශගුණ වෙනස් වීම් නිසා රෝග හා පළිබෝධ උවදුරු වැඩි වීම
- ශාකවල පල හට ගැනීම අඩු වීමත් අකලට පල හට ගැනීමත් සිදු වීම
- නියං තත්ත්ව නිසා පසේ ආම්ලිකතාව ඉහළ යාමෙන් ඉඩම්, වගාවට නුසුදුසු වීම
- සාගර ජල මට්ටම ඉහළ යාම නිසා වෙරළබඩ කෘෂි ඉඩම් වගා කළ නොහැකි තත්ත්වයට පත් වීම
- භෝග අස්වනු අඩු වීම නිසා කෘෂි ආර්ථිකය කඩා වැටීම
- ආහාර සුරක්ෂිතතාව පිළිබඳ ගැටලු ඇති වීම
- ස්වාභාවික විපත් වැඩි වීම නිසා කෘෂි බිම් විනාශ වීම

**කර්මාන්ත**
- අලුත් පරිසර තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වීම නිසා කර්මාන්තවල පිරිවැය ඉහළ යාම
- ස්වාභාවික විපත් ඇති වීම වැඩි වී ඇති බැවින් කර්මාන්ත ශාලා හා නිෂ්පාදන විනාශ වී යාම
- ජල හිඟයට මුහුණ දීමට සිදු වන බැවින් කාර්මික අවශ්‍යතා සඳහා ජලය සීමිත වීම
- ධීවර බිම්වල ව්‍යාප්තිය හා මත්ස්‍ය ගහනය කෙරේ ඇති වන බලපෑම

**වාසස්ථාන**
- සාගර ජල මට්ටම ඉහළ යාමෙන් වෙරළබඩ ජනාවාස විනාශ වීම
- පරිසර උෂ්ණත්වය ඉහළ යාම නිසා වාසස්ථාන තුළ (විශේෂයෙන් නාගරික ප්‍රදේශවල නිවාස සංකීර්ණවල) ජීවත් වීම අපහසු වීම
- බලශක්ති භාවිතයෙන් නිවාස තුළ ජීවත් වීම පහසු තත්ත්වයට පත් කර ගැනීම නිසා බලශක්ති පිරිවැය ඉහළ යාම
- වාසස්ථාන ඉදි කිරීමට යන පිරිවැය වැඩි වීම
- වාසස්ථානවලට ස්වාභාවික විපත්වලින් සිදු වන හානි වැඩි වීම
- නියං සහ ජල ගැලීම් වැනි ස්වාභාවික උපද්‍රව නිසා වාසස්ථානවලට ඇති වන බලපෑම
- අන්තගාමී කාලගුණ තත්ත්වයන් නිසා ඇති වන බලපෑම

**සෞඛ්‍යය**
- රෝග වාහකයන් මඟින් පැතිරෙන බෝ වන රෝග ඉහළ යාම හා රෝග පැතිරීම. උදා: ඩෙංගු, මැලේරියා, බරවා
- අධික උණුසුමට හෝ ශීතලට හෝ නිරාවරණය වීම හා වායු දූෂණය හේතුවෙන් හෘද රෝග හෝ චර්ම පිළිකා වැඩි වීම
- දේශගුණ වෙනස් වීම් කෘෂි නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑමෙන් ආහාර හා පෝෂණ මට්ටම් පහළ යාම මඟින් මන්දපෝෂණය වැනි පෝෂණ ඌනතා ආශ්‍රිත රෝග තත්ත්වයන් වර්ධනය වීම
- පාරිසරික උෂ්ණත්වය වැඩි වීම මඟින් ශ්වසන රෝග ඉහළ යාම

**(ක්ෂේත්‍ර තුනකට බලපාන ආකාරය විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

04). **i.** උතුරු කොරියාව, දකුණු කොරියාව, ජපානය, චීනයේ නැගෙනහිර කොටස

**(මින් දෙකක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)**

ii. **<u>මධ්‍යධරණී බියෝමය</u>**

**ව්‍යාප්තිය :**
- මෙම බියෝම වර්ගය සෑම මහාද්වීපයක ම වෙරළබඩ සීමිත ප්‍රදේශවල දක්නට ඇත.
- යුරෝපයේ හා උතුරු අප්‍රිකාවේ මධ්‍යධරණී මුහුද අවට ප්‍රදේශයේ
- උතුරු ඇමරිකාවේ කැලිෆෝර්නියා
- දකුණු ඇමරිකාවේ බටහිර වෙරළබඩ ප්‍රදේශ (චිලී)
- දකුණු අප්‍රිකාවේ කේප්ටවුන් ආශ්‍රිත ප්‍රදේශය
- ඕස්ට්‍රේලියාවේ පර්ත් සහ ඇඩිලේඩ් අවට

**දේශගුණය :**
- උණුසුම් වියළි දේශගුණයක් පවතී. ග්‍රීෂ්මයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 26.6 - 32.2 සහ සිසිරයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 10 අතර විචලනය වේ.
- වර්ෂාපතනය ශීත ඍතුවේ දී ලැබේ. මධ්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 762ට අඩු වන අතර රිද්මානුකූල වර්ෂාපතනයක් ලැබේ.
- වැසි සහිත සිසිරය හා වැසි නොලබන වියළි ගිම්හානය කැපී පෙනෙන ලක්ෂණ වේ.

**වෘක්ෂලතා :**
- ගිම්හාන නියගයට ඔරොත්තු දෙන ශුෂ්ක රූපී අනුවර්තනයක් ඇත.
- ශාක පත්‍ර කටු සහිත ය. පත්‍ර ඉටිවලින් හෝ දුම්මලෙන් හෝ වැසී ඇත.
- පත්‍රවල පූටිකා සූර්යාලෝකයෙන් ඉවතට හැරෙන පරිදි වක් වූ ස්වභාවයක් ගනී.
- ඝන පොත්ත හා ගැට සහිත කඳන් තිබේ.
- ගැඹුරට විහිදුණු මූල පද්ධති මගින් භූගත ජලය ඇද ගනී.
- බිම් ස්තරය තණකොළවලින් වැසී ඇත. ඊට ඉහළින් ගස් හා පඳුරු වැවී ඇත.
- ශාක විශේෂ : යුකැලිප්ටස්, සීඩර්, ඕක්, ඔලිව්, ටියුලිප්, දේවදර, පයින්, රෝස්මරි, ලැවැන්ඩර්
- සත්ත්ව විශේෂ : මුවා, කුරුලු වර්ග, වෘක විශේෂ, ඩින්ගෝ (වල් බල්ලා)

**(ලක්ෂණ තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

iii. **ශාක ඝනත්වය**
- කාන්තාරවල අධික උෂ්ණත්වය නිසා ශාක ඝනත්වය අඩු ය. ක්ෂේම භූමි ආශ්‍රිත ව පමණක් සාමාන්‍ය ඝනත්වයක් දැකිය හැකිය. කාන්තාර ප්‍රදේශවල සාමාන්‍ය වර්ෂාපතනය අඩු වීම, සාරවත් පසක් දක්නට නොලැබීම නිසා අවම ශාක ව්‍යාප්තියක් දක්නට ලැබීම.
- තුන්ද්‍රා ප්‍රදේශවල අධික ශීත හා දිගු කාලීනහිමපතනය නිසා මතුපිට හිමෙන් වැසී පැවතීම නිසා ශාක ඝනත්වය අඩු ය. තුන්ද්‍රා ප්‍රදේශවල අධික ශීත නිසා ශාක වර්ධනයට කාලයක් නොමැත.

**ශාක විවිධත්වය**
- කාන්තාරවල අඩු ජල තත්ත්වයට අනුවර්තනය වූ ශාක වර්ග දක්නට ලැබේ. මාංසල කඳන් සහිත, කටු බහුල, පත්‍ර අඩු ශාක වර්ග දක්නට ලැබේ.
- තුන්ද්‍රා ප්‍රදේශවල තෘණ වර්ග පමණක් දක්නට ලැබේ. කඳන් නොමැති ශාක දක්නට ලැබේ.

**සත්ත්ව විවිධත්වය**
- කාන්තාරවල අධික උෂ්ණත්වයට හා අඩු ජල තත්ත්වයට අනුවර්තනය වූ සත්ත්ව විශේෂ දක්නට ලැබේ.
- තුන්ද්‍රා ප්‍රදේශවල අධික ශීතල හා සුදු පැහැති පසුබිමට අනුවර්තනය වූ සත්ත්ව විශේෂ දක්නට ලැබේ.

**ජෛව විවිධත්වය**
- කාන්තාරවල හා තුන්ද්‍රා ප්‍රදේශවල ජෛව විවිධත්වය අනෙක් ප්‍රදේශවලට සාපේක්ෂව අඩු ය.

**පාෂාණ ජීර්ණය හා පාංශු නිර්මාණය**
- කාන්තාරවල හා තුන්ද්‍රා ප්‍රදේශවල භෞතික ජීර්ණය ප්‍රබල ව සිදුවේ. ඓන්ද්‍රීය ජීර්ණය අඩු ය. පාංශු මහල් වර්ධනයක් නොමැති තරම් ය.

**(මෙවැනි ලක්ෂණ තුනක් සංසන්දනාත්මක ව පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

iv. - වගාබිම් ප්‍රසාරණය නිසා කාන්තාරීකරණය සිදු වේ. තෘණභූමි ප්‍රදේශවල මෙය ඇති වේ.
- උචිත පාරිසරික සම්පත් සම්පාදනයෙන් වගා කටයුතු සිදු කිරීම (ජලය/පස භාවිතයට ගැනීම ඊජිප්තුව, ලිබියාව)
- නවීන තාක්ෂණික ක්‍රම භාවිතයෙන් කෘෂිකාර්මික කටයුතු සිදු කිරීම (ජාන තාක්ෂණය, හරිත විප්ලවය)
- ප්‍රදේශයට ආගන්තුක වෙනත් ශාක හා සත්ත්ව විශේෂ හඳුන්වා දීම
- පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදනය (සහරා ප්‍රදේශවල සූර්ය, සුළං බලශක්ති නිෂ්පාදනය)
- සංචාරක කර්මාන්තය සඳහා කාන්තාර ආශ්‍රිත ක්‍රියාකාරකම් සැලසුම් කිරීම (වැලි කඳු තරණය, රාත්‍රී උත්සව ආදිය)

**(මෙවැනි වෙනස්කම් තුනක් කෙටියෙන් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05). i. **අවතැන්වීම :** දේශපාලන, වාර්ගික, ආගමික, පාරිසරික උපද්‍රව හේතුවෙන් තම නිත්‍ය පදිංචි ප්‍රදේශය අහිමි වූ ප්ද්ගලයන්
**සරණාගතවීම :** ජාතිය, ආගම, ජාතිකත්වය, දේශපාලන සහ පාරිසරික ආපදා නිසා රටක් හැර යන පුද්ගලයන්

**(පැහැදිලි ව අර්ථයන් වෙන් කර හැඳින්වීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)**

ii. **වයඹ දිග යුරෝපය** - සංවර්ධනය වෙමින් පවතින රටවලින් සිදුවන සංක්‍රමණ ඉහළ යාම
**නැගෙනහිර ආසියාව** - උපත් අනුපාතිකය ඉහළ යාම
- සෞඛ්‍ය පහසුකම්වල දියුණුව හේතුවෙන් මරණ අනුපාතය පහළ බැසීම
- ආයු අපේක්ෂාව ඉහළ මට්ටමක පැවැතීම

**(එක් කලාපයක එක් ජන විද්‍යාත්මක සාධකය බැගින් විස්තර කිරීමට ලකුණු  බැගින් - ලකුණු 6)**

iii. - ගොවි ජනපදකරණය, මහවැලි ගම්මාන, උඩවලව ගංගා සංවර්ධන ව්‍යාපෘතිය මගින් වියළි කලාපීය ප්‍රදේශවලට තෙත් කලාපීය ජනතාව පදිංචි කරවීම
- යුද්ධය නිසා අවතැන් වූ ජනතාව නැවත පදිංචි කරවීම
- ආපදා බහුල ප්‍රදේශවල ජනතාව වෙනත් ප්‍රදේශවල පදිංචි කරවීම
- අධිවේගී මාර්ග, කර්මාන්ත විකේන්ද්‍රණය, ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති නිසා ග්‍රාමීය නාගරික සංක්‍රමණ

**(යනාදී කරුණු තුනක් උදාහරණ සහිත ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

iv. - සංස්කෘතික සම්මිශ්‍රණයට අකැමැති වීම
- ඒ ඒ රටවල ජාතික ආරක්ෂාවට ඇතිවිය හැකි තර්ජන නිසා
- නාගරික ප්‍රදේශවල පොදු පහසුකම් ලබා දීමේ දී ගැටළු මතුවීම
- නීත්‍යානුකුල නොවන සංක්‍රමණ බහුල ව සිදු වීම නිසා
- ආර්ථික පරිහානියට ලක් වූ රටවල් ජනතාව එම රටවලට පැමිණීමට විවිධ සීමා දැමීම

**(යනාදි සාධක තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

**06).**

i. ආර්ථික, සමාජීය, සංස්කෘතික, දේශපාලන ක්‍රියාවලියේ බලපෑම් ලෝකයේ සියලු ප්‍රදේශවල ක්‍රමයෙන් එක හා සමාන තත්ත්වයකට පත්වීමේ ක්‍රියාවලිය **(යනාදි නිවැරදි හැඳින්වීමකට ලකුණු 2)**

ii. - තොරතුරු හා සන්නිවේදන ක්ෂේත්‍රයේ දියුණුව සමඟ ගෝලීයකරණ ක්‍රියාවලිය වේගවත් වීම
- ගෝලීයකරණ ක්‍රියාවලිය විවිධ අංශ යටතේ ක්‍රියාත්මක වීම
- ගෝලීයකරණ ක්‍රියාවලිය විවිධ අභියෝගවලට මුහුණ දීම

**(යනාදි නිවැරදි ගති ලක්ෂණ තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

iii. - ව්‍යාපාර කටයුතු ව්‍යාප්ත කිරීමට වෙනත් රටවල ව්‍යාපාර සඳහා මුදල් ආයෝජනය කිරීම
- ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල නිෂ්පාදන වියදම අඩු වීමත්
- විදේශ ආයෝජන පුළුල් කරගැනීම සඳහා එම රටවල් ආර්ථිකය විවෘත කිරීම
- බදු ප්‍රතිපත්ති ලිහිල් කිරීම, කම්කරු නීති රීති ලිහිල් කිරීම
- ආයෝජකයන්ට අවශ්‍ය යටිතල පහසුකම් පුළුල් කිරීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම
- විදේශීය සමාගම් එම රටවල ආයෝජනය කිරීම වැඩි වීම

**(යනාදි කරුණු තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

iv. - **<u>අහිතකර බලපෑම්</u>**
- අන්තර්ජාලය/සමාජ වෙබ් අඩවි ආදිය සඳහා ශිෂ්‍ය ප්‍රජාව අසීමාන්තික ලෙස ඇබ්බැහි වීම
- බුද්ධිගලනය හා ශ්‍රමගලනය නිසා ඇතිවන අයහපත් බලපෑම් (ගුරුවරුන්, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් වෙනත් රටවලට යාම නිසා ගුරු හිඟය)
- රටේ පවතින අධ්‍යාපන ක්‍රමයට නොගැලපෙන අධ්‍යාපන ක්‍රමවේද භාවිතයට පැමිණීම
- සිසුන් විවිධ නොගැලපෙන අත්හදා බැලීම් සිදු කිරීමට යාම

- **<u>හිතකර බලපෑම්</u>**
- විදේශීය රටවල අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අවස්ථා හිමිවීම
- ගෝලීය දැනුම හා තාක්ෂණය හුවමාරුව
- නව අධ්‍යාපන ක්‍රමවේද භාවිතයට පැමිණීම
- දූරස්ථ අධ්‍යාපන ක්‍රමවේද භාවිතය

**(යනාදි හිතකර හා අහිතකර බලපෑම් දෙකක් විස්තර කිරීමට ලකුණු 3 බැගින් - ලකුණු 6)**

**07).**

i.
- ආවරණ
- සමාජය
- ජාල
- මිනිසා
- ස්වාභාවික පරිසරය

**(මින් හතරක් නිවැරදි ව නම් කිරීමට ලකුණු ඃ බැගින් - ලකුණු 2)**

ii. a. ග්‍රාමීය/ගැමි ජනාවාස - නාගරික ජනාවාස - ගැමි නාගරික ජනාවාස

**(මින් දෙකක් නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)**

b. **ග්‍රාමීය ජනාවාස**
- හුදෙකලා ගෙය හෝ ගොවිපල, කුඩා ගම හා ගම ග්‍රාමීය ජනාවාස ලෙස හැඳින්විය හැකි ය.
- ප්‍රාථමික ආර්ථික කටයුතු කේන්ද්‍ර කරගෙන මෙම ජනාවාස බිහි වේ. ගොවිතැන, ධීවර කර්මාන්තය, සත්ත්ව පාලනය, දඩයම් කිරීම මෙම ප්‍රාථමික ආර්ථික කටයුතු වේ.
- මාර්ග ජාලය අක්‍රමවත් ය. නොදියුණු ය.
- බටහිර රටවල ග්‍රාමීය ජනාවාස ඉතා පහසුවෙන් හඳුනාගත හැකි ය.
- ඒවායේ නිවාස අතර පරතරය වැඩි ය.
- ජන ඝනත්වය අඩු ය. එහෙත් සංවර්ධනය වන රටවල ග්‍රාමීය ජනාවාසවල නිවාස පිහිටා ඇත්තේ විවිධ ආකාරයට ය.
- බොහෝ විට ග්‍රාමීය ජනාවාසවල ගොවිබිම් හා ගොඩනැගිලි ඉදි කළ බිම් පැහැදිලි ව හඳුනා ගැනීමට පුළුවන.
- ග්‍රාමීය ජනාවාසවල තාවකාලික හා ස්ථිර ජනාවාස දක්නට ඇත.
- විශේෂයෙන් ම ආර්ථික කටයුතු හා සම්බන්ධ වූ තාවකාලික, අර්ධ ස්ථාවර ජනාවාස ද ග්‍රාමීය ප්‍රදේශවල ඇත.
- ආහාර සොයා කාලීන ව සංක්‍රමණය වීම, සංචාරක ධීවර කර්මාන්තය, සල ගොවිතැන, ඍතුමය දේශගුණික වෙනස්වීම් ආදි දුෂ්කරතා වැනි දේ නිසා තාවකාලික හා ස්ථාවර ජනාවාස ඇති වේ

**නාගරික ජනාවාස**
- නගරය, මහ නගරය, පුරවරය, නාගරික සමූහිතය හා නගර යාය නාගරික ජනාවාස ලෙස හැඳින්විය හැකි ය.
- සීමිත බිම් ප්‍රමාණයක අධික ජන පිරිසක් වාසය කරති.
- අධික ජනඝනත්වයකින් යුතු කාර්මික පරිපාලන, වාණිජ, අධ්‍යාපනය වැනි කාර්ය ඒකරාශි වී ඇති ජනාවාස වේ.
- නගරයක ඉදි කළ ප්‍රදේශය තුළ මෙම විවිධ කාර්ය ඒකරාශි වී තිබේ.
- ලෝකයේ නාගරික ජනාවාස වර්ධනයේ ශීඝ්‍ර ඉහළයාම වර්තමානයේ දැකිය හැකි ලක්‍ෂණයකි.
- ඉහළ මෙන් ම පහළ තනතුරුවල රැකියා කරන්නෝ නගරවලට සංක්‍රමණය වෙති.
- මුඩුක්කු, පැල්පත්, අඩු පහසුකම් සහිත නිවාස නාගරික ජනාවාසයන්හි තවත් පැතිකඩකි. බොහෝ විට නගරයේ ඇති ආන්තික බිම් ඔවුන්ගේ ජනාවාස බවට පත් වේ.
- ලෝකයේ සැම රටක ම පාහේ නගරවල මුඩුක්කු, පැල්පත් හා අඩු පහසුකම් නිවාස සහිත ජනාවාස මෙන් ම අනවසර ජනාවාස ද දැකිය හැකි ය.
- නගරයේ පැවැත්මට මොවුන්ගෙන් සේවයක් සිදු වන අතර ම නාගරික ගැටලු රැසක් ද ඔවුන් විසින් නිර්මාණය කරනු ලැබේ.

**ගැමි නාගරික ජනාවාස**
- ගම හා නගරය අතර පිහිටි සංක්‍රාන්ති කලාපයක් ලෙස මෙය හැඳින්විය හැකිය.
- ප්‍රාථමික ආර්ථික කටයුතුවල නියුතු පිරිස් ද නගරයේ ද්විතීයක හා තෘතීයක ආර්ථික කටයුතුවල නිරත පිරිස් ද ජීවත් වෙති.
- ගමක ලක්‍ෂණ මෙන් ම  නගරයක ලක්‍ෂණ ද දැකිය හැකි මෙහි ක්‍රමයෙන් නාගරික ලක්‍ෂණ වැඩි වෙමින් පවතියි.
- සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල ගමෙන් පැමිණ නගරයේ රැකියා කරන සාංක්‍රමණිකයන්ගෙන් ගැමි නාගරික කලාපය නිර්මාණය වේ.
- සංවර්ධිත රටවල නගරයේ හර ප්‍රදේශය තුළ ජීවත් වූවෝ නාගරික තදබදයෙන් මිදීමට ගැමි නාගරික කලාපය නේවාසික ප්‍රදේශ වශයෙන් තෝරා ගනිති.

**(යනාදි වශයෙන් එක් ජනාවාසයක ලක්ෂණ නිවැරදි ව පැහැදිලි කිරීමට - ලකුණු 4)**

iii. a. - 1980 සිට 2015 වන විට නාගරික ජන සංඛ්‍යාව ප්‍රතිශතාත්මක ව 50% ඉක්මවා ඇත.
- 2050 වන විට නාගරික ජන සංඛ්‍යාව සමස්ත ජන සංඛ්‍යාවෙන් 3/5 ඉක්මවා යනු ඇත
- ග්‍රාමීය ජන සංඛ්‍යාව කාලික ව ක්‍රමානුකූල ව අඩු වෙමින් පවතී
- 2015 වන විට ලෝක ජන සංඛ්‍යාවෙන් අඩකට වැඩි ප්‍රතිශතයක් නාගරික ප්‍රදේශවල වාසය කරයි

**(යනාදි කරුණු දෙකක් නිවැරදි ව දැක්වීමට ලකුණු 1 බැගින් - ලකුණු 2)**

b. - වර්තමානය වන විට නාගරීකරණය දේශ සීමා අබිබවා ඉන් බැහැරට ව්‍යාප්ත වීම හඳුනාගත හැකි ය.
(බ්ලූ බනානා/ගෝල්ඩන් බනානා/ග්‍රීන් බනානා ආදිය )
- කලාපීය වශයෙන් නාගරීකරණ මට්ටම්වල විශාල වෙනස්කම් පවතී
- ආසියාවේ සහ අප්‍රිකානු කලාපවල නාගරීකරණ සීඝ්‍රතාව ලෝකයේ සෙසු කලාපවලට වඩා වේගවත් ව සිදු වීම
- සංවර්ධනය වන රටවල නාගරීකරණයත් සමඟ අවිධිමත් අංශය ශීඝ්‍රයෙන් වර්ධනය වීම
- මිලියන නගර සහ දැවැන්ත නගර වැඩි වශයෙන් සංවර්ධනය වෙමින් පවත්නා රටවලින් බිහි වීම

**(යනාදි සුවිශේෂතා දෙකක් නිවැරදි ව පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 4)**

iv. - නාගරික කලාපවල කැලිකසළ හා අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- නාගරික සෞඛ්‍ය හා සනීපාරක්‍ෂාව වැඩි දියුණු කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය නගර සභා සහ මහ නගර සභා වැනි ආයතන සමඟ එක් ව විවිධ සෞඛ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම
- නාගරික සමාජ විරෝධී ක්‍රියාකාරකම් වළක්වා ගැනීමට විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- නාගරික පාරිසරික දූෂණය අවම කරලමින් පිරිසිදු නගර නිර්මාණය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- බස්නාහිර පළාත් මහා නාගරික කලාප සංවර්ධන වැඩසටහන, නිවාස දස ලක්‍ෂයේ වැඩසටහන (1984-1986), නිවාස 15 ලක්‍ෂයේ වැඩසටහන (1990-1994) ආදි වැඩසටහන්

**(යනාදි ක්‍රියාමාර්ග තුනක නිවැරදි ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

**08.**

i. A - නිෂ්කර්ෂක කර්මාන්ත  B - මතුපිට කැණීම්  C - භූගත කැණීම්  D - නිෂ්පාදන කර්මාන්ත

**(නිවැරදි ව නම් කිරීමට ලකුණු ½ බැගින් - ලකුණු 2)**

ii. - සන්නිවේදනය  - තාක්ෂණය  - ප්‍රවාහනය  - රාජ්‍ය ප්‍රතිපත්ති  - වෙළඳපොළ
යනාදි සාධකවල බලපෑම් විස්තර විය යුතුය

**(සාධක තුනක බලපෑම් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

iii. - ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව ඇති ඛනිජ සම්පත් උපයෝජනය තුළින් දළ දේශීය නිෂ්පාදිතයට ඇති දායකත්වය (මිනිරන්, හුණුගල්, ඛනිජ වැලි, මැටි, සිලිකා. මැණික් ආදිය)
- විදේශ විනිමය උපයන මාර්ග වීම
- ඛනිජ සම්පත් ආශ්‍රිත සේවා නියුක්තිය
- ප්‍රාදේශීය සංවර්ධනයට ඇති දායකත්වය

**(යනාදි කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

iv. - වැසී ඇති කර්මාන්තශාලා රාජ්‍ය අනුග්‍රහය මත නැවත ස්ථාපිත කිරීමට කටයුතු කිරීම
- ශ්‍රම ගලනය ලෙස සිදුවන ජාන සම්පත් සංක්‍රමණ අවම කිරීමට කටයුතු කිරීම (කාර්මික පුහුණුව ලබා දීම)
- තරුණ ව්‍යවසායකයන් හඳුනා ගැනීම
- නව නිපැයුම්කරුවන් සඳහා ජාතික මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළ සකස් කර දීම සඳහා කටයුතු කිරීම
- දේශීය නිෂ්පාදනවලට ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ඇති ඉල්ලුම ප්‍රයෝජනයට ගෙන සරල අමුද්‍රව්‍ය භාවිතයෙන් කර්මාන්ත ආරම්භ කිරීමට ජනතාව සවිබල ගැන්වීම, ඒවා අධීක්ෂණය කිරීම

**(යනාදි ක්‍රියාමාර්ග තුනක් යෝජනා කර ඒවා පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6)**

❋ ❋ ❋


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න